ශීර්ෂය : 156 - යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

## 1 කොටස

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

---

**1.** අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව

| විසර්ජන ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 215 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව |
| - | ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය |
| - | තරුණ සුභසාධක අරමුදල |
| - | ජාතික යෞවන තිළිණ අධිකාරිය |

**2.** ගිණුම්

2.1 විසර්ජන ගිණුම

(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 8,848,532,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 6,054,575,560 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙළින් රු. 2,443,515,290 ක් හා රු. 350,441,151 ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 34 ක් හා සියයට 22 ක්ව පැවතුනි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 156 | 7,222,532,000 | 4,779,016,711 | 2,443,515,289 | 34 |
| 215 | 1,626,000,000 | 1,275,558,849 | 350,441,151 | 22 |
| එකතුව | 8,848,532,000 | 6,054,575,560 | 2,793,956,441 | 32 |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම්

#### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවකට අදාල රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 15601 | 21,000,000 | 8,944,892 | 14,400,000 | 16,441,654 | 93,000,000 | 58,035,097 |
| 21501 | 60,000,000 | 39,941,136 | 46,000,000 | 62,201,281 | 300,000,000 | 144,922,344 |

## 2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### (අ) අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ශේෂ එකතුව රු. 102,167 ක් විය.

### (ආ) පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් ශේෂවල එකතුව රු 49,053,645 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0066/000 | 24,553,434 |
| | 6000/0000/00/0015/0042/000 | 6,843,000 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0096/000 | 17,657,211 |
| එකතුව | | 49,053,645 |

## 2 කොටස

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

1. **ශීර්ෂය 156 - යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

1.1 විගණන විෂය පථය

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජනවාරි 28 දින අමාත්‍යාංශ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දෙකි.

1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණ

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 110 ට අනුව නියමිත ආකෘතිය ප්‍රකාරව හානි හා පාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

ii. ජාතික යොවුන් සේනාංකය සතු වාහන 47 කට අදාලව වාහන ලොග් පොත් භාවිතා කර අවශ්‍ය තොරතුරු නිසි පරිදි වාර්තා කර නොතිබුණි.

### (ආ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**i.** වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබුණු රු. 1,775,272,500 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

**ii.** වැය විෂයයන් 15 ක් සඳහා ප්‍රතිපාදිත රු. 80,528,890 ක් වූ මුදලින් රු. 52,280,008 ක් ඉතිරිව තිබුණු අතර එසේ ඉතිරිවීම එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 99 අතර පරාසයක පැවතුණි.

**iii.** වැය විෂයන් 2 ක් සඳහා වෙන් කරන ලද රු. 8,500,000 ක් හා රු. 225,000,000 ක් වූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් පිළිවෙලින් සියයට 57.5 ක් හා 10.08 ක් අදාල අරමුණු සඳහා යොදාගැනීමකින් තොරව ඉතිරිව තිබුණි.

**iv.** **විගණන නියැදි පරීක්ෂණයේදී අනාවරණය වූ පරිදි අනුමත** ප්‍රතිපාදන සීමා ඉක්මවා බැරකම්වලට බැඳීම හේතුවෙන් වැය විෂයයන් 19 කට අදාලව එකතුව රු. 4,928,675 කින් ප්‍රතිපාදන වියදම් සීමා ඉක්මවා ගොස් තිබුණි.

(ඇ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 1,960,647 ක් වූ අතර, ඉන් රු. 1,428,522 ක් වූ ශේෂ වර්ෂයකට අඩු කාල පරිච්ඡේදයකට අදාල විය. වර්ෂ 1 ත් 2 ත් අතර කාලපරිච්ඡේදයට අයත් ණය ශේෂය රු. 80,465 කි. රු. 451,660 ක ණය ශේෂය වර්ෂ 5 කට වැඩි කාලපරිච්ඡේදයට අදාල විය.

**1.4 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

I. 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, කුඩා ව්‍යාපාර සංවර්ධන ඒකකයේ දිස්ත්‍රික් කාර්යාල 4 ක භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම විගණන දිනය වූ 2014 දෙසැම්බර් 03 දින වන විටත් සිදුකර නොතිබුණි.

II. ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාල 10 ක දීර්ඝ කාලයක සිට භාවිතයෙන් ඉවත්කල භාණ්ඩ ඒකක 204 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 770 ප්‍රකාරව කටයුතු කිරීම විගණන දිනය වූ 2014 දෙසැම්බර් 03 දින වන විටත් සිදුකර නොතිබුණි. එමෙන්ම මාතර කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණයේදී අතිරික්ත භාණ්ඩ 04 ක් හා ඌනතා භාණ්ඩ 03 ක් හඳුනාගෙන තිබුණත් ඒ සම්බන්ධයෙන් මු.රෙ 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් ඒකක ගණන | වත්කම් ලබාදී ඇති ආයතනය |
|---|---|---|
| මෝටර් වාහන | 01 | තැපැල් සේවා අමාත්‍යාංශය |
| | 07 | අධ්‍යාපන සේවා අමාත්‍යාංශය |
| | 02 | වෘත්තීය පුහුණු අධිකාරිය |
| | 05 | ජාතික යොවුන් සේනාංකය |
| | 01 | ජාතික තරුණ සේවා සභාව |
| | 01 | ජ්‍යෙෂ්ඨ අමාත්‍ය කාර්යාලය |
| | 02 | ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය |

(ඇ)

වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

වෙනත් ආයතන සතුව තිබුණු පහත විස්තර දැක්වෙන වත්කම් විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් අයත්ව තිබුණු ආයතනය | ප්‍රමාණය | කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| | | | අවුරුදු |
| මෝටර් වාහන | ජනාධිපති කාර්යාලය | 1 | 3 |
| | ආරක්ෂක අමාත්‍යාංශය | 1 | 4 |
| | ජාතික ව්‍යාපාර කලමණාකාරීත්ව | 1 | 6 |
| | ආයතනය | 2 | 1 |
| | ජාතික තරුණ සේවා සභාව | 1 | 3 |
| | තැපැල් සේවා අමාත්‍යාංශය | | |

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

i. ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය පිහිටි භූමිය ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් වන අතර, මධ්‍යස්ථානය වෙත ලබාදී ඇති ගොඩනැගිලි හා නිවාස 26 ක් සඳහා අදාල තක්සේරු වටිනාකම ගෙවා මිලදී ගන්නා ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් කිහිප අවස්ථාවකදිම අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කරනු ලැබුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මිලදී ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

ii. ජාතික යොවුන් සේනාංකය විසින් වෙනත් පාර්ශව සතුව තිබුණු ඉඩම්වල මධ්‍යස්ථාන 37 ක් පවත්වාගෙන යමින් ඒවා නඩත්තුව වෙනුවෙන් එකතුව රු. 8,696,537 ක වියදමක් සමාලෝචිත වර්ෂය තුල දරා තිබුණි.

**(ඉ) බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 01 ට අඩු කාලපරිච්ඡේදයකට අයත් බැරකම් රු. 38,541,896 ක් විය.

## 1.5 අනුකූල නොවීම්

(අ) නීති, රීති, හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (i) ව්‍යවස්ථාපිත විධිවිධාන | | |
| 2002 අංක 21 දරන යොවුන් සේනාංක පනතේ | | |

| | | | |
|---|---|---|---|
| | -2 (4) වගන්තිය | - | සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෘත්තීය පුහුණුව, යොවුන් සංවර්ධනය සහ ස්ථාපනය යන කාර්ය සඳහා කමිටු තුනක් පත්කර යොවුන් සේනාංකය විසින් ස්වකීය බලතල ඒ කමිටුවලට පවරනු ලැබිය යුතුව තිබුණද ඒ අනුව ක්‍රියාකර නොතිබුණි. |
| (ii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>--------------------------------------- | | |
| | 11 පරිච්ඡේදයේ 12.12 වගන්තිය | 1,437,611 | ලිත් මාසයකට කලින් දැනුම් නොදී සේවයෙන් ඉවත්ව ගිය නිලධාරීන් 60 දෙනෙකුගෙන් මාසික වැටුප ලෙස රු.1,437,611 ක මුදලක් යොවුන් සේනාංකය වෙත අයවිය යුතුව පැවතුණි. |
| (iii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>-------------------------------------- | | |
| | මුදල් රෙගුලාසි 1646 | - | යොවුන් සේනාංකයේ වාහන සම්බන්ධ දෛනික ධාවන සටහන් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| **(iv)** | 2007 උපදේශකවරුන් බඳවාගැනීමේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>--------------------------------------- | | |
| | 2.3 (ආ) මාර්ගෝපදේශය | 12,852,000 | ජාතික යොවුන් සේනාංකයේ මූලස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා උපදේශකවරුන් තෝරාගැනීමට අදාල වැඩපිළිවෙළ පිළිබඳ වාර්තා තබා ගෙන නොතිබුණි. |
| | 2.3.1 (සී) මාර්ගෝපදේශය | - | උපදේශක සේවාව ලබාගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ විස්තර ඇතුළත් වාර්තා (EOI) සකස්කර ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| 3.2 මාර්ගෝපදේශය | - | උපදේශකවරුන් තෝරාගැනීම සඳහා තරඟකාරී ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. |
| 3.4 මාර්ගෝපදේශය | - | උපදේශක සේවාව සඳහා වැයවන පිරිවැය පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුළත් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි. |
| 3.5 මාර්ගෝපදේශය | - | රුපියල් මිලියන 2 ට වැඩි ඉදිකිරීම් පිළිබඳව ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් උපදේශකවරුන් තෝරාගත යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (v) 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>---------------------------<br>2.5 මාර්ගෝපදේශය | 470,984 | කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය පිහිටි ප්‍රදේශය නවීකරණය කිරීමේ කාර්යයට අදාලව ඉදිරිපත් කරන ලද මිල ගණන් පිළිබඳ විධිමත් ඇගයීමකින් තොරව ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණි. |
| 5.4.4 මාර්ගෝපදේශය | - | ඇප බැඳුම්කර ලබා ගෙන නොතිබුණි. |
| 2.3.2 මාර්ගෝපදේශය | - | ක්ෂේත්‍රය සම්බන්ධව නිපුණතාවයක් ඇති නිලධාරියකුගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණි. |
| 8.9.3 මාර්ගෝපදේශය | - | විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. |

## 1.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

----------------------------------------

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

---------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ කුඩා ව්‍යාපාර සංවර්ධන ඒකකය විසින් එහි අරමුණු ඉටු කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් සඳහා දිස්ත්‍රික් කාර්යාල 8 ක් වෙත රු. 446,000 ක ප්‍රතිපාදන යවා තිබුණත් සැලසුම් කල පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම්

----------------------------------------

යොවුන් සේනාංකය විසින් පහත සඳහන් ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘති නිමනොකර අතහැර දමා තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2013 දෙසැම්බර් 31 දින වනවිට වියදම | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| දිවුලපිටිය යොවුන් සේනාංක මූලස්ථානයේ අලුත් වැඩියා කටයුතු | 6,715,759 | 2011.12.01 | 5,264,220 | කාර්මික නිලධාරීනිය විසින් සකස් කරන ලද ඇස්තමේන්තුවේ අඩුපාඩු තිබීම හේතුවෙන් අදාල කාර්යය නිමකල නොහැකි බව කොන්ත්‍රාත්කරු විසින් දන්වා තිබීම. |

(ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

--------------------------------

අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | 2013 දෙසැම්බර් 31 දින වනවිට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| යොවුන් උද්‍යාන ඉදිකිරීම | රු. | | | රු. | |
| මාතර | 169,000,000 | 2011 | 2011 | 124,781,750 | හේතු ඉදිරිපත් කර නොතිබුණි. |
| බත්තරමුල්ල | ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. | 2010 | 2011 අගෝස්තු | ඉදිරිපත් නොකෙරුණි. | තෝරාගත් ඉඩම නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබා නොදීම. |

### 1.7 කාර්යසාධනය

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව/සංයුක්ත සැලැස්ම/ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### 1.7.1 ජාතික යොවුන් සේනාංකය

2013 වර්ෂය තුළ පුහුණු පාඨමාලා සඳහා බඳවාගත් පළමු කණ්ඩායම වූ සිසුන් 6405 න් සියයට 43.5 ක් පාඨමාලා හැර ගොස් තිබුණු අතර, දෙවන කණ්ඩායම ලෙස බඳවාගත් සිසුන් 3153 න් සියයට 21.8 ක් පාඨමාලා හැරගොස් තිබුණි. 2013 වර්ෂයේ පාඨමාලා අවසන් කල සිසුන්ගෙන් වෘත්තිය පුහුණුවට යොමුකර රැකියා ගත කල ප්‍රමාණය පළමු කණ්ඩායම සියයට 12 හා දෙවන කණ්ඩායම සියයට 5.4 ක පමණ අඩු ප්‍රතිශතයක් විය.

### 1.7.2 කුඩා ව්‍යාපාර සංවර්ධන ඒකකය

තරුණ පරපුර තුළ ව්‍යවසායකත්ව සංවර්ධනය ඇති කිරීම තුළින් ශ්‍රී ලාංකීය ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීම මූලික අරමුණ මත මෙම ආයතනය ආරම්භ කරනු ලැබුවද එහි මෙහෙයුම් ක්‍රියාකාරීත්වය තුළ එනම් ව්‍යවසායකයන් හඳුනාගැනීමේදී හා පුහුණු පාඨමාලා සංවිධානය කිරීමේදී තරුණ පරපුර ඉලක්ක කිරීමේ නැඹුරුතාවයක් නොතිබුණු බවත්, අඛණ්ඩ පසුවිපරමක් තුළින් ආයතනයේ අරමුණු ඉටුකිරීම කෙරෙහි නිසි අවධානය යොමු වී නොමැති බවත් පහත දැක්වෙන කරුණු අනුව නිරීක්ෂණය විය.

I. 2013 දෙසැම්බර් 31 දිනට යාපනය, වවුනියාව, ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර යන දිස්ත්‍රික්කවල නිල වශයෙන් දිස්ත්‍රික් කාර්යාල ආරම්භ කර නොතිබුණු අතර ප්‍රධාන කාර්යාලය මඟින් එම ප්‍රදේශවල ආයතනික කටයුතු සිදුකර තිබුණි. මන්නාරම හා මුලතිව් යන දිස්ත්‍රික්කවල කාර්යාල ස්ථාපිත කර හෝ ආයතනික කටයුතු ක්‍රියාත්මක කර හෝ නොතිබුණි.

II. පානදුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 ජනවාරි 22 පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩමුළුව සඳහා 25 දෙනෙකු සහභාගී වී තිබුණු අතර ඉන් තිදෙනෙකු පමණක් වයස අවුරුදු 30 ට අඩු අය වී තිබුණි. ඉන් විසිදෙදෙනෙක් එම අවස්ථාව වන විටත් ව්‍යාපාරික කටයුතු කරගෙන යන අය වී තිබුණි.

III. පානදුර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2013 අප්‍රේල් 22 ,23 හා 24 යන දින තුනෙහි කරන ලද "ව්‍යාපාරයට මඟ" ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන සඳහා සහභාගී වූ ව්‍යවසායකයින් විසිඅට දෙනාගෙන් පස් දෙනෙකු වයස අවුරුදු 36 ත් 45 ත් අතර වයසේ පසුවූවන් විය. මෙම පස් දෙනාගෙන් හතර දෙනෙකු කුඩා ව්‍යාපාර අංශයට සම්බන්ධ වී ඇත්තේ 2012 වසරේදී වන අතර ව්‍යාපාරය ආරම්භ කර ඇත්තේ 2006, 2007 හා 2009 වසරවලදී වන බවත් නිරීක්ෂණය විය.

IV. කළුතර දිස්ත්‍රික් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද "ව්‍යාපාරයට මඟ" වැඩසටහනට සහභාගී වූවන් අවුරුදු 45 – 60 දක්වා වයස් කාණ්ඩයට අයත් අය වූ අතර වැඩසටහනට 71 දෙනෙකු සහභාගී වී ඇතත් දැනට සාර්ථකව ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන්නේ 11 දෙනෙකු පමණි.

## 1.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

----------------------------------------

### ගැලපුම් කළයුතු ශේෂ

---------------------

යොවුන් සේනාංකය විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව ගෙවීම සඳහා ඉදිරිපත් නොකල චෙක්පත්වල වටිනාකම රු. 87,450 ක් වූ අතර ඉන් 42,500 වටිනාකම වූ චෙක්පත් මාස 06 ත් වර්ෂ 01 ත් අතර කාල පරිච්ඡේදයට අදාල වූ අතර වටිනාකම රු. 44,950 ක් වූ චෙක්පත් වර්ෂ 3ත් 5 ත් අතර කාල පරිච්ඡේදයට අදාල විය.

1.9 අවිධිමත් ගනුදෙනු

-----------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව බෙදහැරීම සඳහා රු. 6,620,000 ක් වැය කර ක්‍රීඩා භාණ්ඩ කට්ටල 500 ක් මිලයට ගෙන තිබුණු අතර සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව හදිසි මිලදීගැනීමක් සේ සලකා මෙම මිලදී ගැනීම සිදුකර තිබුණි. එමෙන්ම මිලදී ගත යුතු ක්‍රීඩා භාණ්ඩ පිළිබඳව විස්තර ඇතුලත් පිරිවිතරයක් හා පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි. මෙම ක්‍රීඩා භාණ්ඩ නියමිත ප්‍රමාණයෙන් විධිමත් පරිදි බෙදා හැර ඇති බවටද තහවුරුවක් නොතිබුණි.

(ආ) දැයට කිරුළ ප්‍රදර්ශන භූමියෙහි රු. 5,500,000 ක් වැයකර පුළුල් තිරයක් සවිකිරීමේ කටයුත්ත ඉතා අත්‍යවශ්‍ය හදිසි මිලදීගැනීමක් ලෙස සලකා ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත සිදුකර තිබුණි. එමෙන්ම මෙම මිලදීගැනීම සිදුකිරීමට පෙර එහි අවශ්‍යතාවය හා පසු පරිභෝජන අවශ්‍යතාව පිළිබඳව සැලකිලිමත් වී නොතිබුණු අතර ප්‍රදර්ශනයෙන් පසු තිරය වෘත්තීය පුහුණු අධිකාරිය වෙත ලබාදී තිබුණි.

(ඇ) දැයට කිරුළ ප්‍රදර්ශනයේ ජාතික යොවුන් සේනාංක ප්‍රදර්ශන කුටියට අවශ්‍ය උපකරණ ලබාදීම සහ අලංකාර කිරීම සඳහා පෞද්ගලික ආයතනයකට රු. 3,114,500 ක් ගෙවා තිබුණු අතර ඊට අදාලව විස්තරාත්මක පිරිවැය වාර්තාවක් සකස් කර නොතිබීමත් විධිමත් ගිවිසුමක් ඇතිකර නොගැනීමත්, කල වැඩ පිළිබඳ විධිමත් සහතිකයකින් තොරව ගෙවීම් කිරීමත් හේතුවෙන් මෙම කාර්යය ආර්ථිකව හා ඵලදායීව සිදුකර ඇති බවට තහවුරුවක් ලබාගත නොහැකි විය.

(ඈ) නිපුණතා පියස එළිමහන් පරිශ්‍රය තාර කාපට් යොදා පිළිසකර කිරීමට අදාලව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 5.6 ට අනුව විස්තරාත්මක පිරිවිතරයක් සකස් කර නොතිබුණි. එමෙන්ම අදාල කාර්යය නිසිලෙස සිදු කල බවට සහතිකයකින් තොරව ඊට අදාල මුළු වටිනාකම වූ රු. 1,560,000 ක මුදල ගෙවා තිබුණි.

1.10 අධිකාර බලය නොමැති වූ ගනුදෙනු
---------------------------------------

ජාතික යොවුන් සේනාංක මූලස්ථානයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුත්තට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන් තොරව තෝරාගත් උපදේශකවරුන්ට පිළිගත හැකි පදනමකින් තොරව කොන්ත්‍රාත් පිරිවැයෙන් සියයට 6 ක ගෙවීමක් ලබාදී තිබුණු අතර වෙනත් පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ඉදිරිපත් කල රු. 775,000 ක් වටිනා කාර්යය සාධන ඇපකරයම මේ සඳහා ද යොදාගැනීමට ආයතනය විසින් අනුමැතිය ලබාදී තිබුණි.

1.11 පාඩු හා හානි
--------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) යොවුන් සේනාංකය විසින් රු. 22,885,000 ක පිරිවැයකට නිළ ඇඳුම් සඳහා දිග කලිසම් 23000 ක් සැපයීමේ කොන්ත්‍රාත්තුව පෞද්ගලික ආයතනයකට ලබාදී තිබුණු අතර 2013 ජනවාරි 15 දිනැති ටෙන්ඩර් ප්‍රදාන ලිපියට අනුව එම නිළ ඇඳුම් 2013 මැයි 10 දිනෙන් අවසන් වන පරිදි අවස්ථා 04 කදී සැපයිය යුතුව තිබුණි. එහෙත් නියමිත දිනට අදාල භාණ්ඩ සපයා නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ **සංග්‍රහයේ 8.14** ප්‍රකාරව පිළිගත හැකි හේතු ලබාගැනීමෙන් තොරව, රෙදි ආනයනයේදී සිදුවූ ප්‍රමාදය නිසා කාලය දීර්ඝ කරන ලෙස සැපයුම්කරු කරන ලද ඉල්ලීමට අනුව ආයතනයේ සභාපති විසින් සියලුම ඇඳුම් සැපයිය යුතු කාලය 2013 ජුනි 25 දක්වා දීර්ඝ කර තිබුණි. මේ අනුව ප්‍රමාද ගාස්තු ලෙස රජයට අයකරගත හැකිව තිබූ විශාල මුදලක් අහිමි වී තිබුණි.

(ආ) යොවුන් සේනාංකය වෙත අවස්ථා 06 කදී රු. 4,591,651 ක් වැයකර පෞද්ගලික ආයතනයකින් බූට් සපත්තු 2500 ක් මිලයට ගෙන තිබුණද ගබඩා ලේඛන අනුව ආයතනයට බූට් සපත්තු 2114 ක් පමණක් ලැබී තිබුණි ඒ අනුව රු. 708,950 ක් වටිනා බූට් සපත්තු 386 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

(ඇ) 2013 ජාතික නිපුණතා හා නව නිර්මාණ තරඟය සඳහා ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පල කරන ලද පුවත්පත් දැන්වීම් සඳහා රු. 41,664 ක මුදලක් වැයකර තිබුණු අතර, අඩුපාඩු රාශියක් සහිතව දැන්වීම් පලකිරීම නිසා නැවත සංශෝධිත පුවත්පත් දැන්වීම් පල කිරීමට රු. 20,400 ක නිෂ්ඵල වැයක් දැරීමට සිදුවී තිබුණි.

1.12 කළමනාකරණ දුර්වලතා
---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

1.12.1 යෞවන රැකියා ජාලය වැඩසටහන ක්‍රියාත්මක නොකිරීම

-----------------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2010 නොවැම්බර් 22 දිනැති අංක 1681/03 අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව යෞවන රැකියා ජාලය, අමාත්‍යාංශය යටතේ වෙනම ආයතනයක් ලෙස ස්ථාපිත කල යුතු වුවද සමාලෝචිත වර්ෂය නිමවන විටත් එය ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම මෙම ආයතනය ක්‍රියාත්මක කිරීම සඳහා 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා එකතුව රු. 3,550,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණත් එම ප්‍රතිපාදන අදාල අරමුණු කරා යොමුකර නොතිබුණි.

(ආ) තවද මීට අදාලව 2006 නොවැම්බර් 10 දිනැති අංක 06/2283/274/015 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් **"යෞවන රැකියා ජාතික ක්‍රියාකාරී සැලැස්ම"** අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර 2006 දෙසැම්බර් 20 දින ඒ සඳහා අනුමැතිය ලබාදී තිබුණි.

I. තරුණ රැකියා සම්පාදනය සඳහා වූ ජාතික වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට ජනාධිපතිවරයාගේ මූලිකත්වයෙන් අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කිරීම.

II. අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ හා වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සහභාගීත්වයෙන් මෙහෙයුම් කමිටුවක් පත් කිරීම.

III. යෞවන රැකියා සම්පාදනය සඳහා වූ ජාතික වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරවීම සඳහා යෞවන රැකියා ජාතික ලේකම් කාර්යාලයක් අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කිරීම.

(ඇ) 2007 අගෝස්තු මාසයේදී තරුණ කටයුතු අමාත්‍යාංශය විසින් ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා ලෝක බැංකුවේ දායකත්වයෙන් ශ්‍රී ලංකාවේ යෞවන රැකියා ජාතික ක්‍රියාකාරී සැලැස්ම එළි දක්වා තිබුණු අතර ඒ තුළ ලංකාවේ විරැකියාව අවම කිරීම සඳහා නිර්දේශද ඉදිරිපත් කර තිබුණි. මෙම ක්‍රියාත්මක සැලැස්ම තුළ තරුණ රැකියා සම්පාදනයේදී ක්‍රියාත්මක කල යුතු වැඩසටහන්, ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග, මාර්ගෝපදේශන හා නිර්දේශ රාශියක් ඉදිරිපත් කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය

අවසන් වන විටත් ඉහත සඳහන් ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත කාරණා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

1.12.2 ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයේ පවිත්‍රතා හා ආරක්ෂක කටයුතු පිළිබඳ තරුණ සේවා සමාගම සමඟ ඇති කරගත් ගිවිසුමේ ඇතුළත් ප්‍රධාන කොන්දේසි 05 ක් සේවා සපයන ආයතනය විසින් කඩකර තිබුණු බැවින් එම සේවාව නිසි පරිදි ලබාගැනීමට නොහැකිවී තිබුණත් ඒ පිළිබඳ කළමණාකරණයේ නිසි අවධානය යොමුවී නොතිබුණි.

1.12.3 විගණන නියැදි පරීක්ෂාවට අනුව, යොවුන් සේනාංකය විසින් පුහුණු මධ්‍යස්ථාන 04 ක් වෙත 2013 සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවල නිකුත් කරන ලද ටී ෂර්ට්, කලිසම් හා සපත්තු ඇතුලත් නිල ඇඳුම් කට්ටල 1181 ක් අදාල මධ්‍යස්ථාන වෙත භාරගත් බවට තහවුරු වන පරිදි පොදු 219 ආකෘතිය ප්‍රකාර තොරතුරු විගණන දිනය වූ 2014 නොවැම්බර් 25 දින වන විටත් යොවුන් සේනාංක ප්‍රධාන කාර්යාලය වෙත එවා නොතිබුණි.

## 1.13 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

i. යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

| සේවක වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 52 | 34 | 18 |
| තෘතියික මට්ටම | 181 | 134 | 47 |
| ද්විතියික මට්ටම | 906 | 663 | 243 |
| ප්‍රාථමික මට්ටම | 77 | 68 | 9 |
| වෙනත්(අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 6 | 1 | 5 |
| එකතුව | 1222 | 900 | 322 |

ii. ජාතික යොවුන් සේනාංකය

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජොෂ්ඨ මට්ටම | 9 | 7 | 2 |
| තෘතියික මට්ටම | 55 | 53 | 2 |
| ද්විතියික මට්ටම | 255 | 215 | 40 |
| කොන්ත්‍රාත් පදනම | 357 | 304 | 53 |
| එකතුව | 676 | 579 | 97 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 97 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

- සමාලෝචිත වර්ෂය තුළදී ද්විතීයික මට්ටමේ නිලධාරීන් 88 දෙනෙකු යොවුන් සේනාංකයෙන් සේවය හැර ගොස් තිබුණු අතර මෙය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 13 ක් විය.

iii. කුඩා ව්‍යාපාර සංවර්ධන ඒකකය

කුඩා ව්‍යාපාර සංවර්ධන ඒකකය අමාත්‍යාංශ විෂය පථය යටතේ පවතින වෙන්වූ ඒකකයක් වන අතර එහි සියලුම කාර්යය මණ්ඩල ශ්‍රේණි ඇතුළත්වන පරිදි සකස් කරන ලද අනුමත කාර්යය මණ්ඩලයක් නොපවතී. තෘතියික මට්ටමේ ශ්‍රේණි ගත රැකියා සඳහා අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය යොදවනු ලැබේ. අනෙකුත් තනතුරු සඳහා අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පහත පරිදි විය.

| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| නි.අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | 18 | 05 | 13 |
| සහකාර අධ්‍යක්ෂ (අධි සේවක) | 05 | 01 | 04 |
| ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරී | 50 | 30 | 20 |
| එකතුව | 73 | 36 | 37 |

ඉහත සඳහන් තොරතුරු අනුව එම ඒකකයේ කාර්යය මණ්ඩල පුරප්පාඩු සැලකිය යුතු ප්‍රමාණයක් පවතින බව නිරීක්ෂණය වේ.

IV. ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය

| සේවක වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| තෘතියික මට්ටම | 5 | 4 | 1 |
| ද්විතියික මට්ටම | 27 | 24 | 3 |
| ප්‍රාථමික මට්ටම | 36 | 32 | 4 |
| එකතුව | 68 | 60 | 08 |

## 02. ශීර්ෂය - 215 කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 22දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය

මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

-------------------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණය

------------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.12 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
| --- | --- |
| බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| පරිගණක උපාංග පිළිබඳ ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැතිඅංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| 2013 ජූලි 12 දිනැති අංක 5ඒ/ඒඑස්/ඒඒ/චක්‍රලේඛ දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | රු.201,544,661 ක් වටිනා වත්කම් කේත අංක යටතේ වර්ග කර දක්වා නොතිබුණි. |

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී සැලැසුම් සහගතව ඇස්තමේන්තු නොකිරීම නිසා වැය විෂයයන් 35 කින් ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් ගෙන් රු. 97,043,200 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මඟින් මාරුකර තිබුණි.

(ඇ) පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්ම වූරු .254,529ක් වූ තැන්පතු 19ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 21501 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.5,060,883ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

## 2.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

### 2.4.1 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙනුවෙන් අමාත්‍යාංශයේ පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු තිරණ 5 ක් සම්බන්ධයෙන් විධිමත් පියවර ගෙන නොතිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| (i) ගොඩනැගිලි | 04 | වර්ෂ 4 ට වැඩි |
| (ii) වාහන | 03 | වර්ෂ 1 ට වැඩි 4 ට අඩු |
| (iii) යන්ත්‍ර සූත්‍ර | 05 | වර්ෂ 4 ට වැඩි |
| (iv)වෙනත් වත්කම් | 64 | වර්ෂ 4 ට වැඩි |

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

කාර්මික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා තාක්ෂණ/කාර්මික විද්‍යාල 38 කට අදාලව 2012 හා 2013 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත හා ඌනතා සම්බන්ධයෙන් හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

### (ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

දෙපාර්තමේන්තුව විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් සංඛ්‍යාව/ඒකකගණන/ප්‍රමාණය | වත්කම් ලබාදී ඇති ආයතනය | වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| (i) ඉඩම්(හෙක්ටයාර) | අක්කර 12 රූඩ් 3 පර්චස් 17 | විශ්ව විද්‍යාල විද්‍යායතනය | 22,000,000 |

| | | | |
|---|---|---|---|
| පර්චස් 110 | | ක්‍රීඩා අමාත්‍යාංශය | ලබා දී නැත |
| අක්කර 07 | | ඌව වෙල්ලස්ස ක්‍රීඩාංගනය | |
| අක්කර 12 | | යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය | |
| අක්කර 1.5 | | විවෘත විශ්ව විද්‍යාලය | |
| පර්චස් 9.5 | | ජී.ජී ප්‍රේමාවතී මිය | |
| (ii) ගොඩනැගිලි | 04 | ක්‍රීඩා අමාත්‍යාංශය | |
| | 02 | මැණික් හා ස්වර්ණාභරණ ආයතනය | |

**(ඇ)** තාක්ෂණ හා කාර්මික විද්‍යාල දහයක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සිසුන් වෙත නිකුත් කරනු ලැබූ පුස්තකාල පොත් 2637 ක් නැවත ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.6 අනුකූල නොවීම්

(අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (i) <u>ව්‍යවස්ථාපිත විධිවිධාන</u> | |
| 1942 අංක 18 දරන රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල් ආඥා පනත හා සංශෝධිත 2003 අංක 17 දරන රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල් පනත | අනියම් හා ආදේශක සේවකයන්ගේ වැටුපෙන් සියයට 8ක දායක මුදලක් අයකර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රේෂණය කළයුතු වුවත්, 2007 සිට 2011 දක්වා දෙපාර්තමේන්තුවේ සේවකයන්ගෙන් අයකර ගත් රු. 527,000 ක මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන ඉන් රු. 296,521 ක් රජයේ ආදායමට බැර කර ඇත. |

(ii) <u>ආයතනසංග්‍රහය</u>

| | |
|---|---|
| II වැනි පරිච්ඡේදයේ 13.3 වගන්තිය | වැඩ ආවරණය කිරීමේ පත්වීම තාවකාලිකව සිදුකළ යුතු වුවත් දෙපාර්තමේන්තු විසින් ලබාදී තිබුණු වැඩ ආවරණ කිරීමේ පත්වීම් අවු: 02 වඩා වැඩි කාලයක් ඉක්මවා ක්‍රියාත්මක වෙමින් තිබුණි. |
| XII වැනි පරිච්ඡේදයේ 10.1.5 වගන්තිය | ඉකුත් නිවාඩු ලබාදීමට අනුමැතිය ලබාදී ඇත්තේ අමාත්‍යාංශ ලේකම්වරයාට වුවත් එවැනි විධිමත් අනුමැතියකින් තොරව වරකාපොල කාර්මික විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට නිවාඩු 17 ½ක් විදුහල්පති විසින් අනුමත කර තිබුණි. |
| XII වැනි පරිච්ඡේදයේ 23:18 වගන්තිය | රජයේ නිලධාරීන් දිවයිනෙන් බැහැර ගත කරන නිවාඩු පිළිබඳ වාර්තාවක් දෙපාර්තමේන්තු ප්‍රධානියා මාස්පතා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි. |

(iii) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u>

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 177 | එකතු කරගන්නා රජයේ මුදල් දෛනිකව බැංකු ගත කළයුතු වුවත් දඹුල්ල කාර්මික විද්‍යාලයේ නිලධාරියෙකු විසින් 2010 සිට 2012 දක්වා කාල පරිච්ඡේදය තුළ අයකර ගනු ලැබූ රු. 38,221 ක මුදලක්, මුදල් පොතේ සටහන් කර බැංකු ගතකර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 1646 . | දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (iv) <u>ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය</u> | අනුරාධපුර තාක්ෂණ විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ජලපෙරන 3 ක් මිලදී ගෙන තිබුණි |

(v) <u>කාර්මික විද්‍යාල මෙහෙයුම් අත්පොත</u>

| | |
|---|---|
| 7.13 (I) ඡේදය | සියළුම පාඨමාලා ප්‍රතීතනය කළයුතු වුවත් 422 ක් වූ මුළු ජාතික වෘත්තීය පාඨමාලා සංඛ්‍යාවෙන් ප්‍රතීතනය කර තිබුණේ පාඨමාලා 284ක් පමණි. |

## 2.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දූර්වලතා

----------------------------------------

2013 වසර සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් රු. මිලියන 99.11 ක වටිනාකමින් යුත් ව්‍යාපෘති 07 ක් සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 2.8 කාර්යසාධනය

------------------

තාක්ෂණික විද්‍යාල 9 ක හා කාර්මික විද්‍යාල 29 ක විභාගයන් සඳහා පෙනී සිටි සිසුන්ගෙන් නියැදියක් ගෙන ප්‍රතිඵල විශ්ලේෂණය කර බැලීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) තාක්ෂණ හා කාර්මික විද්‍යාල 38 හි පවත්වා තිබූ පාඨමාලා 458ක විභාග ප්‍රතිඵල සලකා බැලීමේදී පාඨමාලා 279 ක විභාග සඳහා ඉදිරිපත් වූ සිසුන්ගෙන් සියයට 50 කට වැඩි ප්‍රතිශතයක් සමත් වී තිබුණි. අනෙකුත් පාඨමාලා 179 න් සිසුන් සමත්වී තිබුණේ සියයට 0-සියයට 50 දක්වා අතර පරාසයකි.

(ii) 2013 වසර සඳහා පිළියෙල කරන ලද සංඛ්‍යාලේඛණ අත්පොතට අනුව, 2012 වර්ෂයේදී ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)පාඨමාලා 12 ක් හා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)නොවන පාඨමාලා 37 ක් පවත්වා තිබුණි. ඉන් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)පාඨමාලා 06 ක හා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) නොවන පාඨමාලා 15 ක විභාගවල සමත්වීමේ ප්‍රතිශතය සියයට 50 කට වඩා අඩු මට්ටමක තිබූ බව නිරීක්ෂණය විය.

## 2.9 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ කොන්ත්‍රාත් පරිපාලනයේ පැවැති අඩුපාඩු පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) රාජ්‍ය ප්‍රසම්පාදන කාර්යය පරිපාටියේ අංක 4.3ට අනුව මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී වඩාත් නිවැරදිව හා ආසන්න වශයෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීමට අදාල උපදෙස් සඳහන්වී ඇතත් ඒ අනුව ක්‍රියාකර නොතිබීම නිසා කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ඇල්මක් දක්වන අනෙක් කොන්ත්‍රාත්කරුවන්ට අසාධාරණයක් සිදුවී ඇති බවත් අවසන්

වශයෙන් ආයතනයට ලැබියයුතු මිල වාසිය අහිමි වී ඇති බවත් රු.5,280,062 ක මුදලක් වැය කර දෙපාර්තමේන්තුවේ විදුලි සෝපානයක් සවිකිරීම පිළිබඳ පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) මාතලේ කාර්මික විද්‍යාලයේ දෙමහල් කර්මාන්තශාලා ගොඩනැගිල්ල ඉදිකිරීමේදී එය ඉඩමේ මායිමට සමාන්තරව ඉදිකිරීම සඳහා සියළු සැලසුම් හා ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. නමුත් කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී ගොඩනැගිල්ල ඉදිකරන ස්ථානය වෙනස් කිරීම මත රු. 11,287,068 ක අමතර පිරිවැයක් දැරීමට සිදුවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.10 පාඩු හා හානි

----------------

ගොඩනැගිලි සැලසුම් හෝ මූල්‍ය ප්‍රතිපාදන හෝ කොන්ත්‍රාත්තු පිරිනැමීමකින් තොරව අනුරාධපුර තාක්ෂණ විද්‍යාල භූමිය තුළ නව ගොඩනැගිලි දෙකක් ඉදිකිරීමට බිම සැකසීම හා සමරුපලක සඳහා රු. 364,000 ක වියදමක් දරා තිබුණි.

## 2.11 කළමනාකරණ දුර්වලතා

-----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව සඳහා වරිපනම් ගෙවීමේදී අංක 355 හා අංක 355 ඒ වශයෙන් වරිපනම් අංක දෙකක් යටතේකොළඹ මහ නගර සභාවට වරිපනම් බදු වශයෙන් වාර්ෂිකව පිළිවෙලින් රු. 2,577,778 ක් හා 2,071,111 ක් වශයෙන් ගෙවා ඇතත් එහි නිරවද්‍යතාවය පිළිබඳ තහවුරු කරගෙන නොතිබුණි.

(ආ) කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය මගින් පෞද්ගලික ආයතන 2 ක් සම්බන්ධ කරගෙන කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව හා තාක්ෂණ විද්‍යාල 6 ක් තුළ අධ්‍යාපන කළමනාකරන තොරතුරු පද්ධතිය (EMIS) රු.මිලියන 33,118,046 (බදු රහිත) වැයකර ස්ථාපිත කර තිබූ නමුත් එමගින් බලාපොරොත්තු වූ අරමුණ ඉටුකර ගෙන නොතිබුණි.

(ඇ) වාහන අනතුරු හයක් සම්බන්ධයෙන් අයකර ගත යුතු රු. 3,727,556 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.12** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවකවර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 1313 | 555 | 758 | - |
| (ii) තෘතියික මට්ටම | 144 | 21 | 123 | - |
| (iii) ද්විතියික මට්ටම | 1272 | 778 | 494 | - |
| (iv) ප්‍රාථමික මට්ටම | 1172 | 805 | 367 | - |
| (v) වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 02 | - | 02 |
| එකතුව | 3901 | 2161 | 1742 | 02 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 1742 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ii) පත්වීම් කොන්දේසිවලට අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර නොතිබූ නිලධාරීන්ගේ වැටුප් වර්ධක විලම්භනය කර නොතිබුණි.

(iii) එක් නිලධාරියෙකු විසින් කාර්යක්ෂමතා කඩඉම උත්තීරණය වීම සඳහා ඉදිරිපත් කර තිබූ සහතිකවල සත්‍යතාවය හා එම සහතික ක්ෂේත්‍රයට අදාල ඒවා ද යන්න තහවුරු කරගෙන නොතිබුණි.

(iv) පත්වීම් බලධාරියාගේ අනුමැතියකින් තොරව ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ II පන්තියට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වෙනුවට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් වීම මත නිලධාරියකුගේ අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළ ලෙස සළකා තිබුණි.

(v) ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ නිලධාරියෙකු කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර නොතිබූ නමුත් එම ලිපිය සාවද්‍ය ලෙස වෙනස් කර එකී පරීක්ෂණයෙන් නිදහස් කර තිබූ බව නිරීක්ෂණය විය.

(vi) 1987 වර්ෂයේදී ගොඩනැගිලි උපදේශකවරයෙකු ලෙස පත්වීමක් ලද නිලධාරියෙකුගේ පත්කිරීම් හා උසස් කිරීම්වලට අදාල සුදුසුකම් නිසිලෙස තහවුරු කර නොගෙන උසස් කිරීම් සිදුකර තිබුණි.

(vii) සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තිදෙනෙකු යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට හා ජනාධිපති ලේකම් කාර්යාලයට නිදහස් කර තිබූ අතර ඔවුන්ට වැටුප් වශයෙන් රු.407,620 ක් ගෙවා තිබුණි.

(viii) තනතුරකට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්කිරීම් නොපමාව කළයුතු වුවත් නිත්‍ය තනතුරු 45 ක් පිරවීමට දෙපාර්තමේන්තුව ක්‍රියාකර නොතිබුණි.

## 03. ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය

3.1 ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය සඳහා වූ විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ විදුහල්පතිවරයා වෙත 2015 ජනවාරි 26 දින නිකුත් කරන ලදී.

3.1.1 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

3.1.2 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

3.1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------------

මෙම වාර්තාවේ 3.2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

3.1.4 ආයතනය සංස්ථාගත කිරීම.
------------------------------

2005 අගෝස්තු 18 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 05/ 0994 / 029 / 013 ට අනුව ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය විධිමත් ලෙස සංස්ථාගත කරන තෙක් මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ අනන්‍යතාවය මත තවදුරටත් පවත්වාගෙන යාමට ඉඩදිය යුතු යැයි තීරණය කර තිබුණි. එම තීරණය ලබාදී වර්ෂ 10 ක් ඉක්ම ගොස් තිබියදීත් ආයතනය සංස්ථාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2 මූල්‍ය ප්‍රකාශන
----------------

3.2.1 තත්ත්වාගණනය කළ මතය
-----------------------------

මෙම වාර්තාවේ 3.2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

3.2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

3.2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත
----------------------------------------

ආයතනයේ සේවක කණ්ඩායම් 02 ක් සඳහා ක්‍රම 02 ක් යටතේ සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය හා පාරිතෝෂික දීමනා ගණනය කර තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

3.2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල ප්‍රත්‍යාගණන අතිරික්තය ලෙස රු. 532,074,670 ක් දක්වා තිබුණද විගණනයේදී කරන ලද ගණනය කිරීම් අනුව එම වටිනාකම රු. 514,586,175 ක් විය. ඒ අනුව රු. 17,488,495 ක් ප්‍රත්‍යාගණන අතිරික්තය වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ පත්වීම් ලැබ ආයතනයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව වෙන් කළ යුතු අර්ථසාධක අරමුදලෙහි වටිනාකම රු. 22,018,855 ක් වූ අතර ලෙජරයට අනුව ශේෂය රු. 23,435,838 ක් වී තිබුණි. ඒ අනුව මෙම ශේෂයන් දෙක අතර රු. 1,416,983 ක වෙනසක් නිරීක්ෂණය විය. සේවක අර්ථ සාධක අරමුදල් දායකය ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමෙන් උපයන ලද පොළිය ආදායමක් ලෙස හඳුනාගැනීම වෙනුවට අර්ථසාධක අරමුදල් ගිණුමට බැරකර තිබීම එම වෙනසට හේතු වී තිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිදු කරන ලද ඉදිකිරීමකට අදාලව කෙරීගෙන යන වැඩ සම්බන්ධයෙන් සහතික කළ බිල්පත් ලැබීමට පෙර, වර්ෂ අවසානයේ මූල්‍ය වාර්තාවල රු. 1,894,765 ක ඇස්තමේන්තු වටිනාකමක් කෙරීගෙන යන ගොඩනැගිලි ලෙස සටහන් කර එහි බැර සටහන ණය හිමියන් ලෙස දක්වා තිබුණි. 2013 වර්ෂයේ සහතික කළ බිල්පත් ලැබීමෙන් පසු මුදල් ගෙවීමේදී උක්ත සටහන නොසලකා ගොඩනැගිලි ගිණුමට රු. 1,951,324 ක් හර කර මුදල් බැර කර තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ලෙස ප්‍රත්‍යාගණන වටිනාකමක් ගිණුම්ගත කර තිබුණි. එහි අවසන් ප්‍රතිඵලය ලෙස ශේෂ පත්‍රයේ ණය හිමි ශේෂය රු. 1,894,765 කින් අධිගණනය වී තිබුණි.

(ඈ) බැංකු ජංගම ගිණුමක සමාලෝචිත වර්ෂය අවසාන දිනට මුදල් පොත අනුව ශේෂය රු. 19,133,425 ක් වූ අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එය රු. 19,128,762 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල බැංකු ශේෂය රු. 4,663 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව ආයතනය පරිහරණය කරමින් පවතින වාහන 19 ක ශුද්ධ අගය රු. 439,961 ක් ලෙස සටහන්ව තිබුණු අතර එම වත්කම් ප්‍රත්‍යාගණනය කර නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

2005 වර්ෂයේ සිට පැවත එන රු. 1,133,529 ක ජංගම වත්කම් ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල පැවති අතර ඊට අදාල විස්තර විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

3.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2013 ජනවාරි 01 දිනට නොගෙවූ වේතන ශේෂය වූ රු. 308,496 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි**.**

3.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව යම් කටයුත්තක් සඳහා ලබාදෙන අත්තිකාරම් මුදල් එම කටයුත්ත නිම වූ වහාම පියවීමට කටයුතු කළ යුතු වුවත් භාණ්ඩ මිලදී ගැනීම සඳහා අවස්ථා 21 කදී ලබාදුන් එකතුව රු. 1,252,550 ක් වූ අත්තිකාරම්, භාණ්ඩ මිලදී ගෙන මාස 1-3 ත් අතර කාල ප්‍රමාදයකින් අත්තිකාරම් පියවා තිබුණි.

3.3 මූල්‍ය සමාලෝචනය

3.3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 31,919,207 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 9,811,037 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 22,108,170 ක පිරිහීමක් නිරීක්ෂණය විය. එම පිරිහීම කෙරෙහි ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම් රු. 44,693,792 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.4 මෙහෙයුම් සමාලෝචනය

3.4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුළ පූර්ණකාලීන පාඨමාලා 09 ක් පවත්වා තිබුණු අතර වර්ෂය අවසන් වන විට පාඨමාලා 03 ක් සඳහා ප්‍රතීතණ (NVQ) සහතික ප්‍රදානය කර

තිබුණි. ඉතිරි පාඨමාලා 04 ප්‍රතීතණය කිරීම සඳහා කටයුතු කරමින් පැවති අතර, මිල්රයිට් ශිල්පය හා ඩීසල් කාර්මික ශිල්පය යන පාඨමාලා සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම මඟින් පුහුණු සම්මතයක් සකස් කර නොතිබුණි.

(ආ) වර්ෂ 04 ක පූර්ණකාලීන පාඨමාලා හදාරන සිසුන් සංඛ්‍යාව 1395 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 154,439,216 ක පිරිවැයක් දරා තිබුණි. ඒ අනුව එක් ශිෂ්‍යයකු වෙනුවෙන් වාර්ෂිකව රු. 110,709 ක් හා පාඨමාලාව නිමවන විට ශිෂ්‍යයෙකු වෙනුවෙන් එකතුව රු. 442,836 ක් වැය කිරීමට සිදුවී තිබුණි.

3.4.2. කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය හා පුද්ගලික සමාගමක් අතර 2010 පෙබරවාරි 08 දින ඇතිකරගත් ගිවිසුමට අනුව රු. 1,103,200 ක පිරිවැයකට පරිගණක ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් සපයා සවි කිරීමට තීරණය කර තිබුණු අතර, 2010 හා 2011 වර්ෂවල ඒ සඳහා එකතුව රු. 591,100 ක පිරිවැයක් දරා තිබුණි. ගිවිසුමට අනුව පරිගණක ගිණුම්කරණ පද්ධතිය ස්ථාපිත කිරීම දින 90 ක් තුළ අවසන් කළ යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය නිමවන විටත් පැවති අඩුපාඩු හා දෝෂයන් හේතුවෙන් ගිණුම් සැකසීමට නොහැකි වී තිබුණි. මේ හේතුවෙන් වැය කරන ලද මුදලට ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

(ආ) ආයතනය විසින් සිදුකරනු ලබන නිෂ්පාදන කටයුතු සම්බන්ධයෙන් පිරිවැය ගිණුම්කරන ක්‍රමය මත ගිණුම් තැබීම සිදුකර නොතිබුණි.

(ඇ) ආයතනයට පරිත්‍යාග ලෙස ලැබී ඇති භාණ්ඩ ඉන්වෙන්ට්‍රිගත කර හෝ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ආයතනය සතු වාහන වලට අදාල රක්ෂණ වටිනාකම්, රක්ෂණ දායක මුදල්,අනතුරු හා අලාභ හානි පිළිබඳ විස්තර ඇතුළත් ලේඛන හා ලිපිගොනු විධිමත් පරිදි නඩත්තු කර නොතිබුණි.

(ඉ) 2006 සහ 2007 වර්ෂවලට අදාලව තැන්පත් කර ඇති නමුත් උපලබ්ධි නොවූ වටිනාකම රු. 35,036 ක් වූ මුදල් ඇනවුම් 06 ක් විගණන දිනය වූ 2014 අගෝස්තු 08 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-----------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආධුනික ශිෂ්‍යයන්ට ලබාදෙන ශිෂ්‍යාධාර මුදලින් වාර්ෂිකව රු. 250 ක් අයකරමින් විධිමත් අනුමැතියක් නොමැතිව හා ප්‍රතිලාභ ගෙවීමට ක්‍රමවේදයක් නොමැතිව ආයතනය විසින් ආරම්භකරන ලද පුද්ගල අනතුරු හා රක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අයත් ජංගම ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසාන දිනට ශේෂය රු. 2,404,205 ක් වී තිබුණු අතර ඊට අදාල රු. 3,852,799 ක මුදලක් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළද ශිෂ්‍යාධාර මුදල් වලින් එකතුව රු. 325,900 ක් හා ආයෝජන පොලී ලෙස රු. 388,066 ක් රක්ෂණ අරමුදල වෙත ලැබී තිබුණි. මෙම යෝජනා ක්‍රමය සඳහා නීත්‍යානුකූල පදනමක් ඇති කර එයට දායක වූවන් සඳහා අනතුරුවලට අමතරව ප්‍රතිලාභයන් ලැබෙන පරිදි රක්ෂණ ක්‍රමය විධිමත් කිරීමට ආයතනය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ අර්ථසාධක අරමුදලෙහි දායකත්වය ලබා තිබූ ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයට අනුයුක්ත සේවකයන්ගේ වැටුපෙන් අය කරන ලද සේවක අර්ථ සාධක අරමුදල් දායකය හා එම අරමුදලින් සේවකයන්ට ලබාදෙන ලද ණය සඳහා අය කරන ලද වාරිකවල එකතුව වූ රු. 2,716,773 ක මුදල ශ්‍රී ලංකා මහ බැංකුවට යැවීමට හෝ ඒ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිශ්චිත තීරණයක් නොමැතිව ගෙවිය යුතු අර්ථ සාධක අරමුදල් ලෙස ගිණුම්ගත කර තිබුණි.

3.4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු
----------------------------------
පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් අනුමත පුහුණු පාඨමාලාවන් ක්‍රියාත්මක කිරීමට අමතරව අර්ධකාලීන, කෙටි කාලින හා විශේෂ පුහුණු පාඨමාලාවන් පවත්වා තිබුණි. ඊට අදාලව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

I. මෙම පුහුණු පාඨමාලාවලට අදාල විෂය මාලා සැලසුම් කිරීම විෂය පිළිබඳ ප්‍රවීණතාවයක් ඇති විද්වත් මණ්ඩලයක් විසින් සිදුකර කාලීනව එම විෂයමාලාවන් සංශෝධනය කර නොතිබුණි. එමෙන්ම මෙම පාඨමාලා ආරම්භ කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

II. දේශක දීමනාවලට අමතරව මෙම පාඨමාලාවන් ක්‍රියාත්මක කරන නිලධාරීන් සඳහා විධිමත් අනුමැතියකින් තොරව වර්ෂය තුළ ප්‍රසාද දීමනා ලෙස රු. 179,000 ක් හා පැමිණීමේ දීමනාව ලෙස රු. 1,077,003 ක් ගෙවා තිබුණි. පාඨමාලාවලට අදාල පොදු කාර්යය හා අනෙකුත් පිරිවැය වෙන්කිරීමේ පදනම ද පැහැදිලි නොවුණු අතර ඒ සඳහා ද විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

III. විධිමත් අනුමැතියකින් තොරව මෙම පාඨමාලා ආදායමින් ස්ථාවර තැන්පතුවල හා භාණ්ඩාගාර බිල්පත්වල පිළිවෙලින් රු. 16,430,258 ක් හා රු. 7,056,642 ක් ආයෝජනය කර තිබුණි.

**IV.** සමාලෝචිත වර්ෂය අවසාන දිනට පාඨමාලා ආදායම රු. 41,673,397 ක් වූ අතර වියදම රු. 33,331, 522 ක් විය. පෙර වර්ෂය හා සැසඳීමේදී වියදම සියයට 60 කින් වැඩි වී තිබුණි. මෙම වියදමින් සියයට 87 ක් අර්ධකාලීන පාඨමාලා සඳහා නිලධාරීන්ට ගෙවන දීමනා වූ අතර මෙම දීමනා එක් එක් පාඨමාලා ආදායමෙන් සියයට 26 සිට සියයට 112 ක් දක්වා පරාසයක විහිදී පැවතුණි. මෙසේ දීමනා ගෙවීම සඳහා නිශ්චිත පදනමක් මෙන්ම විධිමත් අනුමැතියක් ලබාගත යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ආ) සේවක පාරිතෝෂික ගණනය කිරීමේ අවිධිමත් භාවය

----------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

I. සේවක පාරිතෝෂික ගණනය කිරීමේදි පාරිතෝෂික දීමනා පනතට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර ඒ සඳහා ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ සභාපතිවරයාගේ ලිපිය පදනම් කර තිබුණි.

II. පාරිතෝෂික ගණනය කිරීම සඳහා මධ්‍යම ගමනාගමන මණ්ඩලයෙන් අනුයුක්ත කළ නිලධාරීන්ට හා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ නිලධාරීන්ට පදනම් දෙකක් අනුගමනය කර තිබුණි.

(ඇ) සේවක අර්ථසාධක අරමුදල් දායකය ගණනය කිරීමේ අවිධිමත් භාවය

සේවක අර්ථ සාධක අරමුදල් දායකය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

I. කම්කරු කොමසාරිස්ගේ 2005 මාර්තු 23 දිනැති අංක සේඅඅ / කම්කො / ලංජර්කාආ /05 ලිපිය පදනම් කර මධ්‍යම ගමනාගමන මණ්ඩලය යටතේ බඳවාගෙන ආයතනයට අනුයුක්ත කළ සේවකයන්ට, වැටුපෙන් සියයට 10 ක් හා ආයතනයෙන් සියයට 12 ක් ලෙස අර්ථසාධක අරමුදල් පනතෙහි 10(1) හා(2) වගන්තියට අනුකූල නොවන පරිදි අර්ථසාධක අරමුදලට දායකත්වය ලබාදී තිබුණි.

II. එම දායක මුදල් ශ්‍රී ලංකා මහ බැංකුවට ප්‍රේෂණය කිරීමෙන් තොරව ආයෝජනය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට මුළු ආයෝජන වටිනාකම රු. 22,307,769 ක් වී තිබුණි.

3.4.5 නිෂ්කාර්යය වත්කම්

ආයතනයේ 25 වන සංවත්සරය සැමරීම සඳහා 1985 වර්ෂයේ නිකුත් කරන ලද ලොතරැයි ටිකට් අලෙවියෙන් ලද රු. 309,792 ක ආදායමක් අදාල අරමුණු කරා යොමු කිරීමෙන් තොරව ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කර තිබුණි.

3.5 පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ප්‍රසම්පාදනය

(ආ) ගිණුම්කරණය

(ඇ) අභ්‍යන්තර පාලනය

(ඈ) සේවක ණය පාලනය

## 04. තරුණ සුභසාධක අරමුදල

## 4.1 හැඳින්වීම

1990 මැයි 15 දිනැති අංක 610/2 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් 1990 අංක 01 දරන හදිසි අවස්ථා (දේපළ රාජසන්තක කිරීමේ) නියෝග මගින් රජයට පවරා ගත් සියලුම චංචල හා නිශ්චල දේපළ, තරුණයන්ගේ සුභසාධන කාර්යයට යොදවා ගැනීමේ අරමුණු ඇතිව 1993 මැයි 24 දිනැති අංක 768/1 දරන අති විශේෂ ගැසට් නිවේදනය පරිදි මහජන ආරක්ෂක පනතේ ( 40 වැනි අධිකාරිය ) 5 වැනි වගන්තිය යටතේ 1993 මැයි 21 දින ජනාධිපතිවරයා විසින් පනවන ලද 1993 අංක 01 දරන තරුණ සුභසාධක අරමුදල නියෝග යටතේ තරුණ සුභසාධක අරමුදල පිහිටුවා තිබුණි. ඒ අනුව, 1993 ජූනි 29 දින සිට එම අරමුදල තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයාගේ විෂය පථයට ඇතුළත් කර තිබිණි.

කෙසේ නමුත්, 1994 අගෝස්තු මාසයේ දී එතෙක් ක්‍රියාත්මක වූ මහජන ආරක්ෂක පනත අහෝසිවීමත් සමඟ එකී පනත යටතේ පනවා තිබුණු 1990 අංක 01 දරන හදිසි අවස්ථා (දේපළ රාජසන්තක කිරීමේ) රෙගුලාසි හා 1993 අංක 01 දරන තරුණ සුභසාධක අරමුදල අක්‍රීය වී තිබුණි.

## 4.2 විගණන නිරීක්ෂණ

(අ) මහජන ආරක්ෂක පනත 1994 අගෝස්තු මාසයේ දී අහෝසිවීම මත අරමුදල අක්‍රීයභාවයට පත් වී ඇති අතර අරමුදලට අදාල ඇවර කිරීමේ ගිණුම් සමාලෝචිත වර්ෂය නිමවන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අරමුදලේ නිශ්චල දේපලවල අයිතිය ජාතික තරුණ සේවා සභාවට පැවරීමට නීත්‍යානුකූල බාධාවක් නොමැති බව 1999 අගෝස්තු 09 දිනැති ලිපිය මගින් නීතිපතිවරයා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා තිබුණද, සමාලෝචිත වර්ෂය නිමවන විටත් එම දේපලවල අයිතිය ජාතික තරුණ සේවා සභාව වෙත විධිමත් පරිදි පවරා නොතිබුණි. එමෙන්ම අරමුදල සතුව තිබු රන් භාණ්ඩ හා මුදල් තැන්පතු නිරවුල් නොවීම පිළිබඳ 2012 වර්ෂයේ විගණන වාර්තා මගින් පෙන්වාදුන් කරුණු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය නිමවන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 05. ජාතික යෞවන තිළිණ අධිකාරිය

-----------------------------------------

### 5.1 පිහිටුවීම

-------

1979 අංක 11 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුකූලව 1979 ජූලි 25 හා 1980 සැප්තැම්බර් 24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි 2007 ජනවාරි 29 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ජාතික යෞවන තිළිණ අධිකාරිය පිහිටුවා තිබුණි. එඩින්බරෝහි ආදිපාදවරයා විසින් 1956 වර්ෂයේ බ්‍රිතාන්‍යයේ දී පිහිටුවන ලද එඩින්බරෝ ආදිපාද තිළිණ ප්‍රදාන යෝජනා ක්‍රමය අනුගමනය කරමින් 1980 වර්ෂයේ දී යෞවන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යාංශය යටතේ ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිතව මෙම අධිකාරිය පිහිටුවන ලදී. ජාතික යෞවන තිළිණ අධිකාරිය පිහිටුවීම වෙනුවෙන් සකස් කළ නියෝග ඇතුළත් කෙටුම්පතක් මත අධිකාරියේ පාලන කටයුතු සිදු කර තිබුණි. එම නියෝග අනුව අධිකාරියේ ප්‍රධාන අරමුණ වූ යෞවන තිළිණ ප්‍රදාන ක්‍රමය සම්බන්ධයෙන් වූ නීති හා පිළිවෙත් එක්සත් රාජධානියේ ඩියුක් ආදිපාද ප්‍රදාන ක්‍රමයේ නීති හා පිළිවෙත් විය යුතු බවට කෙටුම්පත් නියෝගවල සඳහන්ව තිබුණි.

### 5.2 විගණන නිරීක්ෂණ

---------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

2013 වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(ආ) අධිකාරියේ සමාජිකයින් පත් කිරීම.

-------------------------------------

කෙටුම්පත් නියෝග අංක 06 අනුව අධිකාරියේ සමාජිකයින් ඇමතිවරයා විසින් පත්කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය නිමවන විටත් එහි සාමාජිකයින් පත්කර නොතිබුණි.

(ඇ) කාර්යසාධනය

----------------

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩසටහන් 17 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා තරුණ සේවා සභාව වෙත ලැබුණු භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් රු. 5,000,000 ක් අධිකාරිය වෙත ලබාදී තිබුණි. වර්ෂය තුළ සමස්ථ වියදම රු. 4,537,448 ක් වූ අතර ඉන් රු. 2,183,643 ක් වැයකර ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් වැඩසටහන් 08 ක් ක්‍රියාත්මක කර තිබුණු අතර වෙනත් පුනරාවර්තන වියදම් ලෙස එකතුව රු. 2,353,805 ක් වැය කර තිබුණි. තවද වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ වැඩසටහන් 09 ක් ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි.